

කාර්යසාධන චාර්තාව 2021

පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය

නො. 80/5, බිම් මහල, ගොවිජන මන්දිරය
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල

දුරකථන : 011-2883779
ෆැක්ස් : 011-2883985
විද්‍යුත් තැපෑල : stseclivestock@gmail.com

අන්තර්ගතයන්

1.	ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය	01
2.	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	05
3.	වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය	16
4.	කාර්යසාධන දර්ශක	22
5.	තිරසාර සංවර්ධන අරමුණු(SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය	22
6.	මානව සම්පත් පැතිකඩ	23
7.	අනුකූලතා වාර්තාව	25

2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය

වැය ශීර්ෂ අංකය 427

1. ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

පශු සම්පත් ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීමෙහිලා ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වන පශු සම්පත්,ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය, දේශීය නැවුම් කිරි නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිත වීමේ ඉලක්කය ප්‍රමුඛව දේශීය කිරි නිෂ්පාදකයා ශක්තිමත් කරමින් දේශීය කිරි කර්මාන්තය නැංවීම මෙන්ම එළු, කුකුළු, සූකර ඇතුළු අනෙකුත් උප අංශ සංවර්ධනය කර තත්ත්වයෙන් උසස් ගුණාත්මක සත්ත්ව නිෂ්පාදන ප්‍රවර්ධනය හා පරිසර හිතකාමී ලෙස සත්ත්ව පාලනයේ යෙදීම දිරිගැන්වීම උදෙසා දේශීය සහ විදේශීය අරමුදලින් මූල්‍යනය වන විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි.

ඉහළ නිෂ්පාදන ඵලදායීතාවයක් සහිත නීරෝගීමත් සත්ත්ව ගහණයක් පවත්වාගෙන යාම සඳහා කාර්යක්ෂම සත්ත්ව සෞඛ්‍ය සේවාවක් වෙනුවෙන් තාක්ෂණික මගපෙන්වීම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ලබා දෙනු ලබන අතර පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු හා දිවයින පුරා විසිරී පවතින ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල හරහා ක්ෂේත්‍ර මට්ටමේ පශු සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. මීට අමතරව, අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක අනෙකුත් ආයතන වන ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ් හා සී/ස මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගම පශු සම්පත් ක්ෂේත්‍රයේ ප්‍රගමනය වෙනුවෙන් ඒකාබද්ධව කටයුතු කරනු ලබයි.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

1.2.1. දැක්ම

තිරසර පශු සම්පත් සංවර්ධනයක් තුළින් ස්වයංපෝෂිත දැයක්

1.2.2. මෙහෙවර

මනා සම්පත් කළමනාකරණයක් මඟින් දේශීය ඉල්ලුමට සරිලන පරිදි ඉහළ ගුණත්වයකින් යුත් පශු සම්පත් නිෂ්පාදන වර්ධනය සහ දේශීය මෙන්ම අන්තර්ජාතික වෙළෙඳපොල තුළ තරඟකාරීත්වයට සාර්ථකව මුහුණ දිය හැකි පශු සම්පත් ක්ෂේත්‍රයේ නියැලෙන දේශීය ව්‍යවසායකයින් බිහිකිරීම

1.2.3. අරමුණු

- ❖ විවිධ භූගෝලීය ප්‍රදේශ වලට ගැලපෙන පරිදි පශු සම්පත් හඳුන්වාදීම සඳහා පර්යේෂණ සිදුකිරීම සහ කුඩා හා මධ්‍ය පරිමාණ ගොවිපොළ සංවර්ධනය දිරිගැන්වීම
- ❖ පශු සම්පත් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම හා අපනයනය සඳහා දිරිගැන්වීම
- ❖ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හරහා උසස් තත්ත්වයේ තෘණ වර්ග හඳුන්වාදීම
- ❖ මධ්‍යම හා මහා පරිමාණ ගව ගොවිපොළවල් ඉදිකිරීම සඳහා අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් අවශ්‍ය ඉඩම් හා ආයෝජන පහසුකම් සැපයීම

- ❖ රජයේ සත්ත්ව ගොවිපොළවල් උපරිම ලෙස භාවිතා කිරීමේ වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කිරීම
- ❖ කුකුළු මස් හා බිත්තර නිෂ්පාදනය පුළුල් කිරීම සහ අපනයනය කිරීමට දිරිමත් කිරීම
- ❖ කුඩා හා මධ්‍යම පරිමාණ නිෂ්පාදකයින් ප්‍රවර්ධනය කිරීමෙන් දේශීය නිෂ්පාදන හා පරිභෝජන අවස්ථා පුළුල් කිරීම
- ❖ සත්ත්ව ගොවිපොළවල් සහ නිෂ්පාදන පහසුකම් සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ ඵලදායී අධීක්ෂණ පද්ධති හඳුන්වාදීම
- ❖ පශු වෛද්‍ය පහසුකම් පුළුල් කිරීම මගින් කුඩා හා මධ්‍යම පරිමාණ ගොවීන් සඳහා පහසුකම් සැලසීම

1.3. ප්‍රධාන කාර්යයන්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා විසින් 2020 අගෝස්තු 09 දිනැති අංක 2187/27 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මගින් පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය වෙත පවරා ඇති කාර්යයන් හා කර්තව්‍යයන් පහත දක්වා ඇත.

- ❖ කෘෂිකර්ම අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "නව තාක්ෂණික කෘෂි කර්මාන්තයක්" ඇති කිරීම සඳහා අදාළ නීති සහ අණපනත් වලට අනුකූලව පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහායවීම
- ❖ ජාතික අයවැය හා ආයෝජන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- ❖ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්, කාර්යයන්, ඊට අදාළ ප්‍රතිපත්ති හා වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

1.4. සංවිධාන සටහන


ලේකම්
අතිරේක ලේකම් (පාලන) (ශ්‍රී.ලං.ප.සේ.විශේෂ ශ්‍රේණිය) 01
අතිරේක ලේකම් (පශු සම්පත් සංවර්ධන) (ශ්‍රී.ලං.ස.නි.සෞ.සේ. විශේෂ ශ්‍රේණිය) 01
අතිරේක ලේකම් (ශ්‍රී.ලං.කෘෂි.සේ.විශේෂ ශ්‍රේණිය) 01
අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී.ලං.ඉ.සේ.විශේෂ ශ්‍රේණිය) 01
ප්‍රධාන මූල්‍ය නිලධාරී (ශ්‍රී.ලං.ග.සේ.විශේෂ ශ්‍රේණිය) 01
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) (ශ්‍රී.ලං.ප.සේ. I) 01
අධ්‍යක්ෂ (සැලසුම්) (ශ්‍රී.ලං.ක්‍ර.සේ.I) 01
අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ස.නි.සෞ.සේ. I) 03
අධ්‍යක්ෂ (ඉංජිනේරු) (ශ්‍රී.ලං.ඉ.සේ.I)01
ප්‍රධාන ගණකාධිකාරී (ශ්‍රී.ලං.ග.සේ.I) 01
ප්‍රධාන අභ්‍යන්තර විගණක (ශ්‍රී.ලං.ග.සේ.I) 01
සහකාර ලේකම් (ශ්‍රී.ලං.ප.සේ II/III) 02
නීති නිලධාරී (දෙපාර්තමේන්තුගත) 01
නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) (ශ්‍රී.ලං.ක්‍ර.සේ. II/III) 02
නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ/ පශු වෛද්‍ය නිලධාරී (ශ්‍රී.ලං.ස.නි.සෞ.සේ. II/III) 08
නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.කෘෂි.සේ. II/III) 01
ගණකාධිකාරී (ශ්‍රී.ලං.ග.සේ.II/III) 01
අභ්‍යන්තර විගණක (ශ්‍රී.ලං.ග.සේ.II/III) 01
ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්
පරිපාලන නිලධාරී 01
භාෂා පරිවර්තක 02
සංවර්ධන නිලධාරී හා සමාන්තර සේවා
කළමනාකරණ සේවා නිලධාරී
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර 01
රියදුරු 20
කා.සේ.සේ
නිශ්චල ඡායාරූප ශිල්පී 01 (දෙපාර්තමේන්තුගත)
පිළිගැනීමේ නිලධාරී 01 (දෙපාර්තමේන්තුගත)
වීඩියෝ කැමරා ශිල්පී (තාවකාලික) 01
වීඩියෝ කැමරා සහායක(තාවකාලික) 01
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරී
කා.සේ.සේ
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරී
කා.සේ.සේ
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරී
කා.සේ.සේ
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරී
කා.සේ.සේ
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරී
කා.සේ.සේ
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරී
කා.සේ.සේ

1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

- ❖ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

1.6. අමාත්‍යාංශය යටතේ පවතින ආයතන/අරමුදල්

- ❖ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය
- ❖ මිල්කෝ (ප්‍රයිවට්) ලිමටඩ්
- ❖ සී/ස මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගම
- ❖ සී/ස ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්ගලික) සමාගම

(දැනට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතු කරමින් සිටී)

1.7. විදේශාධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

#	*ව්‍යාපෘතියේ නම*	*දායක නියෝජිතායතනය*	*ඇස්තමේන්තුගත වියදම (රු.මී.)*	*කාල සීමාව*
01	*බඩල්ගම නව කිරි සැකසුම් මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම*	*ඩෙන්මාර්ක් රජය*	*11,783.00*	*2016-2022*
02	*කුඩා පරිමාණ කිරි සැකසුම් මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම*	*ප්‍රංශ රජය*	*4,086.00*	*2018-2022*

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2021 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය (දෙසැම්බර් 31 දිනට)

#	වැඩසටහන / ව්‍යාපෘතිය	2021 අයවැය ප්‍රතිපාදන (රු.මී.)	භෞතික ප්‍රගතිය (%)	මූල්‍ය ප්‍රගතිය (රු.මී.)	විශේෂ
1.	දියර කිරි පරිභෝජනය ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරීම	136.0	75	92.17	2020 බිල්පත් සඳහා රු.මී. 3.23 ක් ගෙවා ඇත
2.	අභිජනන ගොවිපොළවල් ස්ථාපනය කිරීම	100.0	80	81.84	
3.	පශු සම්පත් සංවර්ධන මධ්‍යකාලීන වැඩසටහන	46.0	74	27.18	2020 බිල්පත් සඳහා රු.මී. 4.28 ක් ගෙවා ඇත.
4.	කුඩා හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපොළ සංවර්ධනය	45.0	90	44.53	
5.	සූකර කර්මාන්ත සංවර්ධන වැඩසටහන	15.0	87	13.07	
6.	කුඩා හා මධ්‍ය පරිමාණ කිරි ගොවිපොළ කළමනාකරණය තුළින් ඵලදායීතාවය ඉහළ නැංවීම	450.0	75	275.24	
7.	ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් පොළොන්නරුව ගොවිපොළෙහි පෝෂ්‍ය තෘණවලින් සයිලේජ් නිපදවීමේ ව්‍යාපෘතිය	250.0	80	222.59	
උප එකතුව		**1,042.0**		**756.62**	
කෘෂිකර්ම අමාත්‍යාංශය (වැය ශීර්ෂ 118) යටතේ ප්‍රතිපාදන සලසා ඇති, අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක විදේශාධාර ව්‍යාපෘති					
8.	බඩල්ගම නව කිරි සැකසුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම (ශ්‍රී ලංකා /ඩෙන්මාර්ක්)	290.0(12) 23.0(17)	94	57.68(12) 5.31(17)	
9.	කුඩා පරිමාණ කිරි සැකසුම් මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම (ශ්‍රී ලංකා /ප්‍රංශ)	1,711.0(12) 270.0(17)	42	1,710.90(12) 0.005(17)	
උප එකතුව		**2,001.0(12) 293.0(17)**		**1,768.58(12) 5.315(17)**	

12-විදේශ ණය *17-විදේශ ණය ආශ්‍රිත දේශීය පිරිවැය*

2.1. දියර කිරි පරිභෝජනය ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරීමේ වැඩසටහන

දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සහ පාරිභෝගික ප්‍රජාව අතර නැවුම් කිරි පරිභෝජනය වැඩි කිරීම හා ප්‍රචලිත කිරීම මෙහි ප්‍රධාන අරමුණයි. සමාලෝචිත වර්ෂය සඳහා රු.මී.136 ක ප්‍රතිපාදන ලබා දී ඇති අතර, මේ යටතේ පහත ක්‍රියාකාරකම් සිදුකර ඇත.

2.1.1. පාසැල් ළමුන් අතර දියර කිරි පරිභෝජනය ප්‍රචලිත කිරීම

සෑම පළාතක්ම ආවරණය වන පරිදි තෝරාගත් පාසල් සඳහා දියර කිරි ප්‍රචලිත කිරීමේ වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කළද 2021 වසරෙහි රට තුළ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන්

අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීමට නොහැකි විය. මේ යටතේ ඌව පළාත තුළ සීමිත පිරිසක් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වූ අතර, දකුණු පළාත් පාසැල් සිසුන් සඳහා දැනුවත් කිරීමේ පත්‍රිකා මුද්‍රණය කිරීමට රු.මි. 0.608 ක මුදලක් වැය කර ඇත.

2.1.2. කිරි සැකසුම් මධ්‍යස්ථාන ස්ථාපනය හා නවීකරණය කිරීම

මේ යටතේ කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන සැකසුම් කිරීමේ නිරත පෞද්ගලික ව්‍යවසායකයින් සඳහා සියයට 50 ක රජයේ දායකත්වය යටතේ රු. 200,000 ක උපරිමයකට යටත්ව අවශ්‍ය උපකරණ මිලට ගැනීම සඳහා දායකත්වය සපයනු ලබයි. මේ යටතේ කිරි සැකසුම් මධ්‍යස්ථාන 139 ක් සංවර්ධනය කිරීමට අවශ්‍ය යෙදවුම් සැපයීම සඳහා රු. මි. 18.39 ක මුදලක් ආයෝජනය කර ඇත.




කිරි සැකසුම් මධ්‍යස්ථාන සඳහා ලබාදුන් යෙදවුම්

2.1.3. කිරි අලෙවිසැල් ස්ථාපිත කිරීම

මේ යටතේ දියර කිරි පරිභෝජනය ඉහළ නැංවීමේ අරමුණින් ප්‍රාදේශීය මට්ටමින් කිරි අලෙවිසැල් ස්ථාපිත කර ඇත. කිරි අලෙවිසැල් 10 ක් ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය යෙදවුම් ලබා දීමට රු. මි. 4.34 ක මුදලක් වැය කර ඇත.




නැගෙනහිර පළාත තුළ ස්ථාපනය කරන ලද කිරි අලෙවි සැල්

2.1.4. කිරි ශීත කිරීමේ ටැංකි ලබාදීම

දියර කිරි එකතුකිරීම හා බෙදාහැරීම වැඩිදියුණු කිරීම සඳහා වයඹ පළාතේ තෝරා ගත් කිරි ගොවි සමිති 06 ක් සඳහා සියයට 50 ක රජයේ දායකත්වය මත කිරි ශීත කිරීමේ ටැංකි 06 ක් ලබා දී ඇත. මේ සඳහා ආයෝජනය කළ මුදල රු.මි. 2.847 කි.

2.1.5. කාන්තාවන් සවිබල ගැන්වීමේ වැඩසටහන

කාන්තාවන් සවිබල ගැන්වීම හා දිළිඳුකම පිටුදැකීමේ අරමුණින් කාන්තා මූලික පවුල් සඳහා කිරි ගව කර්මාන්තයේ නිරත වීමට ඉඩ ප්‍රස්තාවන් සැපයීමට සියයට 50ක රජයේ දායකත්වය යටතේ රු.100,000 ක උපරිමයකට යටත්ව, අවශ්‍ය කිරි දොවන යන්ත්‍ර, කිරි අතුරු නිෂ්පාදනයට අවශ්‍ය උපකරණ හා එළදෙනුන් මිලට ගැනීමට දායකත්වය සපයනු ලබයි. ඒ අනුව 2021 වර්ෂය තුළ කාන්තා මූලික පවුල් 130 ක් සඳහා ප්‍රතිලාභ ලබා දීමට රු.මි. 10.46 මුදලක් ආයෝජනය කර ඇත.

2.1.6. පිරිසිදු එළකිරි නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය යෙදවුම් ලබාදීම

මෙම වැඩසටහන යටතේ එළකිරි පිරිසිදුව පාරිභෝගිකයාට සහ කිරි එකතුකිරීමේ මධ්‍යස්ථාන වෙත ලබාදීමේ අරමුණින් ගවගාල පිරිසිදුව තබාගැනීමට සහ පිරිසිදුව කිරි දොවාගැනීමට අවශ්‍ය යෙදවුම් සපයාගැනීම සඳහා සියයට 50ක රජයේ දායකත්වය යටතේ රු.200,000 ක උපරිමයකට යටත්ව ප්‍රතිලාභීන් 248 දෙනෙකු සඳහා ආයේජනය කළ මුදල රු.මි. 8.88 කි.

2.1.7. මිල්කෝ සමාගමේ කිරි එකතුකිරීමේ මධ්‍යස්ථාන වෙත කිරි විශ්ලේෂක යන්ත්‍ර ලබාදීමෙන් කිරි එකතුකිරීමේ මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම

මෙම වැඩසටහන යටතේ දියර කිරිවල නියමිත ප්‍රමිතිය පරීක්ෂා කිරීම සහ කිරි ගොවියාට ඒ සඳහා නියමිත මිලක් ලබාදීමේ අරමුණින් මිල්කෝ සමාගමේ කිරි එකතුකිරීමේ මධ්‍යස්ථාන වෙත සියයට 50ක රජයේ දායකත්වය යටතේ කිරි විශ්ලේෂක යන්ත්‍ර 100ක් ලබාදීම සඳහා රු.මි.14.33ක් ආයෝජනය කර ඇත.

2.1.8. කිරි සිසිලක යන්ත්‍ර ලබාදීම

මෙම වැඩසටහන යටතේ සවස් වරුවේ කිරි දෙවීම සහ එම කිරි පසුදින උදය වරුවේ කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන වෙත ලබාදීමට කිරි ගොවීන් වෙත පහසුකම් සැලසීම සඳහා උෂ්ණත්වය පාලනය කළ හැකි කිරි කෑන් 75 ක් සියයට 50 රජයේ දායකත්වය යටතේ කිරි ගොවීන් සහ කිරි සමිති 75 ක් අතර බෙදාදෙන ලදී. මේ සඳහා ආයෝජනය කළ මුදල රු.මි. 3 කි.

2.1.9. පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවලට අයත් කිරි අතුරු නිෂ්පාදන මධ්‍යස්ථාන හා පුහුණු මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම හා ස්ථාපනය කිරීම

සමාලෝචිත වර්ෂය තුළදී පුහුණු මධ්‍යස්ථාන 06 ක් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සම්පාදනයට එක් මධ්‍යස්ථානයකට රු.මි. 5 ක උපරිමයකට යටත්ව රු.මි. 30 ක් ආයෝජනය කෙරේ. මේ යටතේ පළාත් 06 ක කිරි සැකසුම් හා පුහුණු මධ්‍යස්ථාන 06 ක් වැඩි දියුණු කිරීම සඳහා රු.මි. 26.079 ක මුදලක් ලබා දී ඇත.





මධ්‍යම පළාත තුළ ස්ථාපනය කරන ලද පුහුණු මධ්‍යස්ථාන

2.2. අභිජනන ගොවිපොළවල් ස්ථාපනය කිරීම

දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම පිණිස අවශ්‍ය උසස් ආරයේ කිරි දෙනුන්ගේ හිඟකම මගහරවා ගැනීම සඳහා දීපව්‍යාප්තව අභිජනන ගොවිපොළ සංවර්ධනය කිරීම ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතිය යටතේ පහත සඳහන් උප ව්‍යාපෘතීන් 02 ක්‍රියාත්මකවේ.

2.2.1. පෞද්ගලික අභිජනන ගොවිපොළ සංවර්ධන උප ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි. 37ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර, එමගින් පෞද්ගලික අභිජනන ගොවිපොළ 175 ක් සංවර්ධනය කර ඇත. මේ සඳහා වැය වූ මුදල රු.මි. 34.863 කි.

2.2.2. රජයේ අභිජනන ගොවිපොළ සංවර්ධන උප ව්‍යාපෘතිය

මේ යටතේ පළාත් මට්ටමින් රජයේ අභිජනන ගොවිපොළ 09 ක් සංවර්ධනය කිරීමට අපේක්ෂිත අතර, එක් ගොවිපොළක් සඳහා රු.මි. 10 ක උපරිමයකට යටත්ව අදාළ ගොවිපොළේ සංවර්ධන අවශ්‍යතාවයන් මත අවශ්‍ය යෙදවුම් ලබාදීම සිදුකර ඇත. මේ සඳහා ආයෝජනය කළ මුදල රු.මි. 46.861 ක් වන අතර, සමාලෝචිත කාල සීමාව අවසන් වනවිට අභිජනන ගොවිපොළ 09 ක සංවර්ධන කටයුතු සිදුකර ඇත.



හතරලියද්ද ගව අභිජනන ගොවිපොළ



නැගෙනහිර පළාතේ එළු අභිජනන ගොවිපොළක්

2.3. පශු සම්පත් සංවර්ධන මධ්‍යකාලීන වැඩසටහන

පශු සම්පත් ක්ෂේත්‍රය දියුණු කිරීම සඳහා උතුරු පළාතෙහි පවතින විශාල විභවය තුළ පශු වෛද්‍ය කාර්යාල හා අනෙකුත් යටිතල පහසුකම් ස්ථාපනය කිරීම මගින් පශු සම්පත් ක්ෂේත්‍රයේ සේවා සැපයුම වැඩිදියුණු කිරීමට කටයුතු කර ඇත. 2021 වසර තුළ ඉදිකරන ලද නිල නිවාස හා කාර්යාල පිළිබඳ විස්තර පහත පරිදි වේ.

විස්තරය	*ආයෝජිත මුදල (රු.මි.)*
මන්නාරම පශු වෛද්‍ය කාර්යාලයේ ඉතිරිව තිබූ ඉදිකිරීම් කටයුතු නිම කිරීම	*2.002*
උතුරු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් බහුකාර්ය ගොඩනැගිල්ලේ ඉතිරි ඉදිකිරීම් කටයුතු සියයට 75ක් පමණ අවසන් කිරීම	*20.925*
මුරුන්ගන් පශු වෛද්‍ය කාර්යාලයේ නිල නිවාස අලුත්වැඩියා කටයුතු අවසන් කිරීම	*1.986*
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා ඒ යටතේ පවතින ආයතන සඳහා ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ සැපයීම	*2.265*



මන්නාරම පශු වෛද්‍ය කාර්යාල ගොඩනැගිල්ල



මුරුන්ගන් පශු වෛද්‍ය කාර්යාලයේ නිල නිවාස



ඉදිවෙමින් පවතින උතුරු පළාත් බහුකාර්ය ගොඩනැගිල්ල

2.4. සුළු හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපොළ සංවර්ධන වැඩසටහන

කුකුළු නිෂ්පාදනයන්ගෙන් රට ස්වයංපෝෂිත කිරීම සඳහා කුකුළු ගොවිපොළ ඇති කිරීම හා කුකුළු නිෂ්පාදන පරිභෝජනය ප්‍රවලිත කිරීම, අපනයන වෙළෙඳපොළ ඉලක්ක කර ගනිමින් නව නිෂ්පාදන බිහිකිරීම සහ නව ව්‍යවසායකයින් කුකුළු පාලන ක්ෂේත්‍රය සඳහා යොමු කිරීම මෙම වැඩසටහනෙහි අරමුණු වේ. මේ යටතේ, කුඩා හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපොළ ස්ථාපනය (කුකුළු පැටවුන් 100, 50,10 බැගින් වන ඒකක), මස් සැකසීම සහ ශීත ගබඩා මධ්‍යස්ථාන පිහිටුවීම හා වැඩිදියුණු කිරීම සහ කුකුළු ආහාර ස්වයං මිශ්‍ර කිරීම හා කුකුළු මස් ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මකවේ. මේ සඳහා සමස්ත ආයෝජනය රු.මි. 45 කි.

සමාලෝචිත වර්ෂය තුළදී මස් සැකසීම සහ ශීත කාමර පහසුකම් මධ්‍යස්ථාන පිහිටුවීම හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති 16 ක් ද, කුකුළු ආහාර ස්වයං මිශ්‍ර කිරීම හා කුකුළු මස් ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් 15 ක් ද නිම කර ඇත. මේ සඳහා රු.මි. 40 ක් ආයෝජනය කර ඇත.



ආගරපතන ප්‍රදේශයේ පිහිටවූ කුකුළු ගොවිපොළක්



කුකුළු පැටවුන් බෙදා දීම - නැගෙනහිර පළාත

2.5. පරිසර හිතකාමී සූකර ගොවිපොළ සංවර්ධන වැඩසටහන

පාරිසරික ගැටළු අවම කර සූකර කර්මාන්තය දියුණු කිරීම සඳහා අවශ්‍ය යෙදවුම් සැපයීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. සමාලෝචිත වර්ෂයේදී අපේක්ෂිත ආයෝජනය රු.මි. 15 ක් වූ අතර, ඉලක්කගත සූකර ගොවිපොළ ප්‍රමාණය 78ක් විය. සමාලෝචිත වර්ෂය අවසන් වනවිට දිවයිනේ පළාත් 7 ක් ආවරණය වන පරිදි පරිසර හිතකාමී සූකර ගොවිපොළ 76 ක් ස්ථාපනය කිරීම සඳහා රු.මි. 13 ක මුදලක් ආයෝජනය කර ඇත.



මස්කෙළිය පරිසර හිතකාමී සූකර ගොවිපොළ



ස්ථාපනය කරන ලද ජීව වායු ඒකකයක්- කොස්ගම පශු වෛද්‍ය කොට්ඨාශය

2.6. කුඩා හා මධ්‍ය පරිමාණ කිරි ගොවිපොළ කළමනාකරණය තුළින් ඵලදායීතාවය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය

කුඩා හා මධ්‍ය පරිමාණ කිරි ගොවිපොළවල ඵලදායිතාව ඉහළ නැංවීම තුළින් දේශීය දියර කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම මෙහි ප්‍රධාන අරමුණ වේ. එම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා සත්ත්ව පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම හා සත්ත්ව අභිජනන හැකියාව ඉහළ නැංවීම යන ප්‍රධාන වැඩසටහන් දීපව්‍යාප්තව පළාත් මට්ටමින් ක්‍රියාත්මක කර ඇත. 2021 වර්ෂය සඳහා රු.මි. 450 ක ප්‍රතිපාදන ලබා දී ඇත.

2.6.1. සත්ත්ව පෝෂණ වැඩසටහන

සතුන්ගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් මෙම වැඩසටහන දීපව්‍යාප්තව ක්‍රියාත්මකවිය. සමාලෝචිත වසර අවසානය වන විට මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම්වල ප්‍රගතිය පහතින් දක්වා ඇත.

#	*ක්‍රියාකාරකම*	*ප්‍රගතිය*
1.	*තෘණ හා පෝෂ්‍ය ශාක වගා කිරීම, සංරක්ෂණය, සයිලේජ් නිෂ්පාදනය හා ඊට අදාළ උපකරණ ලබාදීම*	*තෘණ හා පෝෂ්‍ය ශාක වගා සහ සංරක්ෂණ ඒකක 369 ක් පිහිටුවා ඇත* *සයිලේජ් නිෂ්පාදන ඒකක 234ක් පිහිටුවා ඇත* *ගොවි මහතුන්ගේ 50%ක දායකත්වය යටතේ ප්‍රතිලාභී ගොවීන් 552 දෙනෙකුට අදාළ උපකරණ ලබා දී ඇත*
2.	*සතුන් සඳහා සාන්ද්‍ර ආහාර හා ඛනිජ ලවණ ලබාදීම තුළින් පෝෂණය ඉහළ නැංවීම*	*කිරි ගවයින්ගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම සඳහා ගොවි මහතුන් වෙත සාන්ද්‍ර ආහාර ලබා දීමට කටයුතු කර ඇති අතර, මේ සඳහා වැය කර ඇති මුදල රු.මි. 1.94 කි.*
3.	*කුඩා පරිමාණ ආහාර මිශ්‍රණාගාර ඇති කිරීම*	*මේ යටතේ රු.මි. 2.49 ක් ආයෝජනයෙන් ගොවි මහතුන්ගේ 50%ක දායකත්වය යටතේ ආහාර මිශ්‍රණාගාර 11ක් ඉදිකර ඇත.*
4.	*පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවලට අයත් ගොවිපොළවල තෘණ ආදර්ශණ පිහිටුවීම*	*තෘණ ආදර්ශණ 05 ක් පිහිටුවීම සඳහා රු.මි.19.21ක් වැය කර ඇත.*



තුම්බන්කර්නි ගොවිපොළෙහි පෝෂ්‍ය තෘණ වගා කිරීම - නැගෙනහිර පළාත



මධ්‍යම පළාතෙහි සයිලේජ් සැකසීමේ ව්‍යාපෘතියක්

2.6.2. සත්ත්ව අභිජනන වැඩසටහන

සතුන්ගේ අභිජනන හැකියාව ඉහළ නැංවීමේ අරමුණින් මෙම වැඩසටහන දීපව්‍යාප්තව පළාත් මට්ටමින් ක්‍රියාත්මක කරන ලද අතර, මේ යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් සිදුකර ඇත.

- ❖ සත්ත්ව ගොවිපොළ සංවර්ධනය (උසස් ආරයේ පට්ටි ගවයින් ලබාදීම, කිරි ගවයින් ලබාදීම, ගවගාල් හා ජීව වායු ඒකක ස්ථාපනය, අභිජනන සතුන් සංවර්ධනය)
  2021 වර්ෂය තුළ ගොවි මහතුන්ගේ 50% ක දායකත්වය යටතේ කිරි ගොවිපොළ 876ක් සංවර්ධනය කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දී ඇත.

- ❖ වියළි දේශගුණයට ඉතා හොඳින් ඔරොත්තු දෙන නැගෙනහිර පළාතේ බහුලව දක්නට ලැබෙන සුදු ගව (White Cattle) සංරක්ෂණය හා වැඩිදියුණු කිරීම යටතේ ඉහළ නිෂ්පාදනයක් ඇති සතුන් තෝරා අභිජනනය කිරීමට රු.මි. 4.631ක පිරිවැයක් දරා නැගෙනහිර පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ සුදු ගව සංරක්ෂණ මධ්‍යස්ථානයක් පිහිටුවීමට හා සතුන් ලබාදීමට කටයුතු කර ඇත.

- ❖ පට්ටි ගොනුන් සංවර්ධනය කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවීමට අදාළව නැගෙනහිර පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තිරුක්කෝවිල් පුං ගව මධ්‍යස්ථානය සංවර්ධනය සඳහා ආයෝජිත මුදල රු.මි. 1.94 කි.

- ❖ සතුන්ගේ අභිජනන ගැටලු නිරාකරණය සඳහා හෝර්මෝන හා ඛනිජ ලවණ ලබාදීම
  මේ යටතේ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු මගින් මිලදීගත් රු.මි. 29.81ක වටිනාකමින් යුතු හෝර්මෝන හා ඛනිජ ලවණ පශු වෛද්‍ය කාර්යාල හරහා කිරි ගවයින්ගේ අභිජනන තත්ත්වය ඉහළ නැංවීමට ලබා දී ඇත.

- ❖ අභිජනන කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා උපකරණ ලබාදීම
  මේ යටතේ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු වෙත අභිජනන කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය උපකරණ ලබා දීමට රු.මි. 11.65 ක මුදලක් ආයෝජනය කර ඇත.

- ❖ ගවයින් හඳුනාගැනීමේ වැඩසටහන යටතේ සතුන් 100,000කගේ කන් සලකුණු කිරීම හා කන් සලකුණු මිලදීගැනීම සඳහා රු.මි.8 ක් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට ලබාදී ඇත. මේ යටතේ සතුන් 11,493 දෙනෙකුගේ කන් සලකුණු කිරීම් සිදු කර ඇත.

- ❖ කිරි ගොවීන් වෙත සේවා සැපයීම සඳහා මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත කෘත්‍රිම සිංචන පහසුකම් සැපයීමට අවශ්‍ය උපකරණ ලබාදීම . මේ සඳහා සිදුකළ ආයෝජනය රු.මි. 5.1 කි.




නැගෙනහිර පළාතේ සුදු ගව (White Cattle) සංරක්ෂණය කිරීම සඳහා පිහිටුවන ලද මධ්‍යස්ථානයක්

2.7. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් පොළොන්නරුව ගොවිපොළෙහි පෝෂ්‍ය තෘණවලින් සයිලේජ් නිපදවීමේ ව්‍යාපෘතිය

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ කිරි නිෂ්පාදනය වැඩි කර ගැනීම සඳහා සතුන්ට අවශ්‍ය ආහාර සැපයීමට ප්‍රමාණවත් සංරක්ෂිත තෘණ තොග ගොවිපොළවල් තුළ පවත්වා ගැනීම අවශ්‍ය කරුණකි. ඒ අනුව, මණ්ඩලයට අයත් පොළොන්නරුව ගොවිපොළෙහි අක්කර 500 ක භූමි ප්‍රමාණය තුළ පෝෂ්‍ය තෘණ වගා කර සයිලේජ් නිෂ්පාදනය මගින් ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ සත්ත්ව ආහාර සුලභ කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. මේ සඳහා සමස්ත ආයෝජනය රු.මි. 250 කි. තෘණ වගාවට අවශ්‍ය යන්ත්‍රෝපකරණ, සයිලේජ් බේල් කිරීමේ යන්ත්‍ර, බීජ සිටුවීමේ යන්ත්‍ර, නඟුල් හා දැති පෝරු ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් ලබාගෙන තෘණ වගා කටයුතු සිදුකරමින් පවතී.





පෝෂ්‍ය තෘණ වගා කිරීම සඳහා පොළොන්නරුව ගොවිපොළෙහි බීම් සකස් කිරීමේ දර්ශනයක්

❖ කෘෂිකර්ම අමාත්‍යාංශය (වැය ශීර්ෂ 118) යටතේ ප්‍රතිපාදන සලසා ඇති, අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක විදේශාධාර ව්‍යාපෘති

2.8. බඩල්ගම නව කිරි සැකසුම් මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම

මිල්කො සමාගමට අයත් කොළඹ නාරාහේන්පිට පිහිටි කිරි සැකසුම් කර්මාන්තශාලාව, බඩල්ගම පිහිටි ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් සිරිංගපාත ගොවිපොළෙහි ස්ථාපනය කිරීමට තීරණය කරන ලදී. මෙම ව්‍යාපෘතිය ඩෙන්මාර්ක් රජයේ සහයෝගීතාව මත ක්‍රියාත්මක වන අතර, එහි පළමු අදියර යටතේ, කර්මාන්තශාලාව ඉදිකිරීම සඳහා 2016.05.18 දින මුල්ගල තැබීම සිදු කරන ලදී.

සමාලෝචිත කාල සීමාව අවසන් වනවිට සමස්ත භෞතික ප්‍රගතිය සියයට 94 ක් වන අතර එක් එක් කාර්යයන්හි ප්‍රගතිය පහත පරිදිවේ.

කාර්යය	*භෞතික ප්‍රගතිය (%)*	*ආයෝජනය*
කිරි කර්මාන්තශාලා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු	*99*	
පරිපාලන හා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම	*99*	
ආපනශාලා ගොඩනැගිල්ල, සේවක පහසුකම් ඇතිකිරීම	*98*	
කාර්යමණ්ඩල නිල නිවාස සහ ආරක්ෂක කුටි ඉදිකිරීම	*99*	
විදුලි ජනන ඒකකය ස්ථාපිත කිරීම	*100*	
යාන්ත්‍රික සහ විදුලි ආශ්‍රිත සවිකිරීම් කටයුතු	*88*	
යන්ත්‍රෝපකරණ කොටස් සහ ඉදිකිරීම් ද්‍රව්‍ය බහාලුම් 55 ක් ආනයනය කිරීම		*යුරෝ මිලියන 59.43*
ආනයනික යන්ත්‍රෝපකරණ සඳහා දේශීය අරමුදලින් බදු ගෙවීම		*රු.මි.5.30*



කිරි කර්මාන්තශාලා ගොඩනැගිල්ල



කිරි සැකසුම් යන්ත්‍රෝපකරණ

2.9. කුඩා පරිමාණ කිරි නිෂ්පාදකයින්ගේ සමූපකාර සමිති සංවර්ධනය කිරීම

ශ්‍රී ලංකාවේ කිරි කර්මාන්තය නඟාසිටුවීමේ අරමුණින් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වනුයේ අගය එකතු කරන ලද කිරි නිෂ්පාදන අදාළ ප්‍රදේශවලම නිෂ්පාදනය කර කිරි පරිභෝජනය ප්‍රචලිත කිරීම මගින් ප්‍රජාවේ පෝෂණ මට්ටම ඉහළ නැංවීමය. මේ යටතේ තෝරාගත් ප්‍රදේශවල කුඩා පරිමාණ කිරි සැකසුම් මධ්‍යස්ථාන 06 ක් ස්ථාපනය කර සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන අතර, මේ සඳහා අපේක්ෂිත ආයෝජනය යුරෝ මිලියන 13.9 කි.

ව්‍යාපෘතියට අදාළ සැපයුම් කොන්ත්‍රාත් ගිවිසුම 2019.02.27 දින අත්සන් තබා ඇත. දෛනික නිෂ්පාදන ධාරිතාවය ලීටර් 5,000 ක් බැගින් වන කුඩා පරිමාණ කිරි සැකසුම් මධ්‍යස්ථාන 04 ක් තෝරාගත් ප්‍රතිලාභී කිරි සමිති 04 ක ස්ථාපනය කර ඇත. නාවලපිටිය කිරි නිෂ්පාදන සමූපකාර සමිතිය සහ හොරණ බණ්ඩාරගම හෙරිටේජ් හෙළගොවි කිරි නිෂ්පාදන සමූපකාර සමිතිය ඉතිරි ප්‍රතිලාභී කිරි සමිති ලෙස තෝරා ගෙන ඇත. 2022 ජනවාරි මසදී එම ප්‍රතිලාභීන් වෙත යන්ත්‍රෝපකරණ ආනයනය කිරීමට නියමිතව ඇත.

සමාලෝචිත කාල සීමාව අවසන් වනවිට මෙම ව්‍යාපෘතියෙහි සමස්ත භෞතික ප්‍රගතිය සියයට 42 ක් වන අතර, ඒ පිළිබඳ විස්තර පහත පරිදිවේ.

කිරි සැකසුම් මධ්‍යස්ථානය		භෞතික ප්‍රගතිය (%)	විශේෂ කරුණු
01.	අත්තනගල්ල කිරි නිපදවන්නන්ගේ සමූපකාර සමිතිය	96	
02.	සී/ස දිස්ත්‍රික් කිරි සැපයුම්කරුවන්ගේ සමූපකාර සමිතිය, පොළොන්නරුව	95	
03.	සක්සිඩ් ඉන්ටර්නැෂනල් (පුද්ගලික) සමාගම, වෙන්නප්පුව	95	
04.	කුඩා පරිමාණ කිරි පට්ටි සංවර්ධන පදනම, වාරියපොළ	96	
05.	සී/ස නාවලපිටිය විවිධ සේවා සමූපකාර සමිතිය	-	කර්මාන්තශාලා ගොඩනැගිල්ල මේ වන විට ඉදිවෙමින් පවතී
06.	හෙරිටේජ් හෙළ ගොවි සංවර්ධන සමිතිය, කැප්පෙටිපොළ	-	
ව්‍යාපෘතියට අදාළ යන්ත්‍රෝපකරණ ආනයනය වෙනුවෙන් වියදම			යූරෝ මිලියන 12.43





කුඩා පරිමාණ කිරි පට්ටි සංවර්ධන පදනම, වාරියපොළ





සක්සිඩ් ඉන්ටර්නැෂනල් (පුද්.) සමාගම, වෙන්නප්පුව





සී/ස දිස්ත්‍රික් කිරි සැපයුම්කරුවන්ගේ සමූපකාර සමිතිය, පොළොන්නරුව





අත්තනගල්ල කිරි නිපදවන්නන්ගේ සමූපකාර සමිතිය

2.10. අමාත්‍යාංශය මගින් 2022 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති

2022 වසර තුළ ඒකාබද්ධ අරමුදල මගින් මූල්‍යනය කර ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතීන් පිළිබඳ විස්තර පහත පරිදිවේ.

#	ව්‍යාපෘතිය	අරමුණු	අපේක්ෂිත ආයෝජනය (රු.මි.)
1.	දියර කිරි පරිභෝජනය ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරීම	දේශීය දියර කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම මගින් කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන ආනයනය සීමා කිරීම	25.0
2.	සතුන් අභිජනනය කිරීමේ ගොවිපොළ ස්ථාපනය කිරීම	දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා උසස් ආරයේ කිරි දෙනුන් සුලභ කිරීම	25.0
3.	මධ්‍යකාලීන පශු සම්පත් සංවර්ධන වැඩසටහන	උතුරු පළාතේ පශු සම්පත් සංවර්ධන ක්ෂේත්‍රයෙහි යටිතල පහසුකම් සංවර්ධනය	40.0
4.	කුඩා හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපොළ සංවර්ධනය කිරීම	කුකුළු මස්, බිත්තර ආශ්‍රිත නිෂ්පාදනයන්ගෙන් රට ස්වයංපෝෂිත කිරීම	15.0
5.	සූකර කර්මාන්ත සංවර්ධනය	සූකර කර්මාන්තය හා ආශ්‍රිත නිෂ්පාදන වලින් රට ස්වයංපෝෂිත කිරීම	30.0
6.	ඵලදායිතා වැඩිදියුණු කිරීම තුළින් මධ්‍යම හා කුඩා පරිමාණ කිරි ගොවිපොළ ප්‍රවර්ධනය කිරිම	ගොවිපොළ කළමනාකරණය, පෝෂණය හා අභිජනනය සංවර්ධනය තුළින් දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම	120.0
7.	එළු පොකුරු ගම්මාන ස්ථාපිත කිරීම	එළු ගොවිපොළ සංවර්ධනය තුළින් දේශීය එළු මස් හා එම නිෂ්පාදන අලෙවිය ප්‍රවර්ධනය	15.0
8.	කුඩා හා මධ්‍ය පරිමාණ කිරි ගොවිපොළ කළමනාකරණය තුළින් ඵලදායීතාවය ඉහළ නැංවීම	දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම	1,000.0
	එකතුව		**1,270**

අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘතීන්හි ප්‍රගතිය හා ඉදිරි දැක්මට අදාළව දෙවන පරිච්ඡේදය මගින් ඉදිරිපත් කර ඇති තොරතුරු සත්‍ය බව සහතික කරමි.



3. 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය (2021)		සටහන	තත්‍ය		
			2021	2020	
	ආදායම් ලැබීම්				
	ආදායම් බදු	1	-	-	**ඒසීඒ-1**
	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
	අන්තර් ජාතික වෙළෙඳාම මත බදු	3	-	-	
	බදු නොවන ආදායම් සහ වෙනත්	4	-	-	
	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
	ආදායම් නොවන ලැබීම්		-	-	
	භාණ්ඩාගාර අග්‍රිම		1,097,969,975	299,248,083	**ඒසීඒ-3**
	තැන්පතු		29,622,914	2,127,245	**ඒසීඒ-4**
	අත්තිකාරම් ගිණුම්		15,732,628	13,618,831	**ඒසීඒ-5/5(අ)**
	වෙනත් ලැබීම්		18,840,183	6,254,362	
	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**1,162,165,700**	**321,248,521**	
	මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ=(අ)+(ආ)		**1,162,165,700**	**321,248,521**	
	අඩු කළා:වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	**ඒසීඒ-2(11)**
275,100,000	වේතන,වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	255,566,626	327,077,756	
56,850,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	49,736,488	37,974,162	
2,000,000	සහනාධාර, සහනාධාර ප්‍රදාන සහ මාරු කිරීම්	7	1,496,677	1,285,000	
-	පොළී ගෙවීම්	8	-	-	
200,000	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
334,150,000	**මුළු පුනරාවර්තන වියදම් (ඇ)**		**306,799,791**	**366,336,918**	
	මූලධන වියදම්				**ඒසීඒ-2(11)**
10,012,746	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම්	10	9,443,867	3,026,362	

අයවැය (2021)		සටහන	තත්‍ය		
			2021	2020	
13,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	8,831,719	870,000	
700,000,000	ප්‍රාග්ධන පැවරීම්	12	497,828,163	-	
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	**ඒසිඒ-2(11)**
500,000	හැකියා වර්ධනය	14	360,500	165,000	
345,427,000	වෙනත් මූලධන වියදම්	15	262,220,849	144,608,240	
1,068,939,746	**මුළු මූලධන වියදම්(ඉ)**		**778,685,098**	**148,669,602**	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		65,294	-	
	තැන්පතු ගෙවීම්		22,517,577	670,908	**ඒසිඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		13,726,469	3,349,194	**ඒසිඒ-5/5(අ)**
	මුළු වියදම් උ= (ඇ+ඉ+ඊ)		**1,121,794,229**	**519,026,622**	
-	**2021දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)**		**40,371,471**	**(197,778,101)**	-

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පි

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය	
		2021 (රු.)	2020 (රු.)
<u>මූල්‍ය නොවන වත්කම්</u>			
දේපල,පිරියත හා උපකරණ	ඒසිඒ-6	616,180,716	606,196,184
<u>මූල්‍ය වත්කම්</u>			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ -5/5 (අ)	39,736,332	41,742,490
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ -3	-	-
මුළු වත්කම්		**655,917,048**	**647,938,674**
<u>ශුද්ධ වත්කම්/ස්කන්ධය</u>			
ශුද්ධ වත්කම්		9,410,140	18,521,636
දේපළ, පිරියත හා උපකරණ සංචිතය		616,180,716	606,196,184
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(ආ)		
<u>ජංගම වගකීම්</u>			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	30,326,192	23,220,854
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**655,917,048**	**647,938,674**

පිටු අංක 07 සිට 62 දක්වා ඉහත ඒසීඒ- 1 සිට ඒසීඒ- 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 64 සිට 73 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තරද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා ,ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.



3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන
මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	තත්‍ය	
	2021 (රු.)	**නැවත ගලපන ලද 2020 (රු.)**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	18,774,889	6,254,362
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	1,097,969,975	299,248,083
අත්තිකාරම් අයකර ගැනීම්	11,453,448	4,213,051
තැන්පතු ලැබීම්	29,622,914	1,524,607
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**1,157,821,226**	**311,240,103**
අඩුකළා: මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	299,571,993	125,367,300
සහනාධාර සහ මාරුකිරීම්	1,496,677	403,672
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	70,978,094	143,438,819
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
අත්තිකාරම් ගෙවීම්	10,332,153	1,310,316
තැන්පතු ගෙවීම්	1,147,411	45,750
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**383,526,328**	**270,565,857**

	තත්‍ය	
	2021 (රු.)	නැවත ගලපන ලද 2020 (රු.)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**774,294,898**	**40,674,246**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොලී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා: මුදල් වැයකිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	**774,294,898**	**40,674,246**
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**774,294,898**	**40,674,246**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(774,294,898)**	**(40,674,246)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ)+(ඊ)	**0**	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා: මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ)=(උ)+(ඒ)	0	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

1. වාර්තාකරණ කාලපරිච්ඡේදය

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2. මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර, සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා

නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි. මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3. ආදායම් හඳුනාගැනීම

භුවමාරු හා භුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාල සීමාව නොසලකා, මුදල් ලැබෙන කාල පරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4. දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනා ගන්නා අතර, පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථා වලදී නැවත තක්සේරු කරන ලද අගය යොදා ගනී.

5. දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම, දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6. මුදල් හා මුදල් සමාන දෑ

2021 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි වලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.5. ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු.000'

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම-2021	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2002-01-01	රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී	350	350	705	201%
2002-02-99	පොළිය - අනෙකුත්	2,000	2,000	1,540	77%
2003-99-00	විකුණුම් හා ගාස්තු - අනෙකුත් ලැබීම්	1,600	1,600	1,919	119%
2003-02-99	විකුණුම් හා ගාස්තු - පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම්-විවිධ	-	-	48	-
2004-01-00	වැන්දඹු හා අනත්දරු	-	-	14,000	-

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු.000'

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන,අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	334,150.00	334,150.00	306,799.79	92%
ප්‍රාග්ධන	1,060,700.00	1,068,939.74	778,685.09	73%

3.7. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.000'

#	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
1	සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, පේරාදෙනිය	කෘත්‍රිම සිංචන උපකරණ මිලදී ගැනීම	5,032	5,032	5,032	100%
2	සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, පේරාදෙනිය	කන් සලකුණු මිලදී ගැනීම	8,000	8,000	-	0%
3	රජයේ මුද්‍රණාලයාධිපති	ලිපි ගොනු මුද්‍රණය කිරීමට	156	156	156	100%
4	සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, පේරාදෙනිය	අධිශීත ගව ශුක්‍ර මිලදී ගැනීම	1,000	1,000	-	0%
5	කෘෂිකර්ම අමාත්‍යාංශය	විදුලි හා ජල බිල්පත්	2,290	2,290	2,290	100%
6		ආරක්ෂක හා පිරිසිදු කිරීමේ ගාස්තු	2,400	2,400	2,400	100%
7		ආරක්ෂක හා පිරිසිදු කිරීමේ ගාස්තු	727	727	727	100%
එකතුව			19,605	19,605	10,605	

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු. 000'

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2021 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2021 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය% ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්				
9152	යන්ත්‍රෝපකරණ		616,180.716		
9153	ඉඩම්				
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරිගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. එස්එල්එන්/ඔ/එස්එමඑල්/එෆ්ආර්/2/2021/6

මගේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2022 මැයි 31 දින

ලැබුණු අංශය
03 JUN 2022

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය

පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කළ මතය

පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර 2021 අගෝස්තු 21 දිනැති අංක 02/2021 දරණ රාජ්‍ය මුදල් වක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම්, විගණකගේ වගකීම් යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි 2021 අගෝස්තු 21 දිනැති අංක 02/2021 දරණ රාජ්‍ය මුදල් වක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී

සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම්, චේතනාන්විත මඟහැරීම්, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇති වීමට හේතු වේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- ඔළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප නොවන බවට පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අත්තිකාරම් ලැබීම් හා නැන්පතු ලැබීම් වශයෙන් පිළිවෙලින් රු.11,453,448 ක් හා රු.29,622,914 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණු අතර ඉකුත් වර්ෂයේ ඊට අදාළ සංසන්දනාත්මක අගයන් වූ රු.4,213,051 ක් හා රු.1,524,607 ක් පිළිවෙලින් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් යටතේ හා මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා තිබුණි. එමෙන්ම එම වෙනස්කම් පිලිබඳව මූල්‍ය ප්‍රකාශන වල හෙලිදරව් කිරීමක්ද සිදු කර නොතිබුණි.

(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අත්තිකාරම් ගෙවීම් හා නැන්පතු ගෙවීම් වශයෙන් පිළිවෙලින් රු.10,332,153 හා රු.1,147,411 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ප්‍රවාහයන් යටතේ දක්වා තිබුණු අතර ඉකුත් වර්ෂයේ ඊට අදාළ සංසන්දනාත්මක අගයන් වූ රු.1,310,316 ක් හා රු.45,750 ක් පිළිවෙලින් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ යටතේ හා මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ දක්වා තිබුණි. එමෙන්ම එම වෙනස්කම් පිලිබඳව මූල්‍ය ප්‍රකාශන වල හෙලිදරව් කිරීමක්ද සිදු කර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඡේද යොමුව	විගණන නිරීක්ෂණය	නිර්දේශය
2.3 (i)	අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.
2.4 (iii)	2020.10.02 දිනැති වත්කම් කළමණාකරණ චක්‍රලේඛ අංක 5 / 2020 02 (අ) ප්‍රකාරව ධාවන තත්වයේ නොපවතින වාහන 2020.12.31 දිනට පෙර අපහරණය කළ යුතු වුවත් 251- 0747, JR - 2899 , හා 65-6120 යන ධාවනයට නුසුදුසු තත්වයේ පවතින වාහන 03 ක් අමාත්‍යාංශ පරිශ්‍රයේ ගාල් කර පැවතිණි.	2020.10.02 දිනැති වත්කම් කළමණාකරණ චක්‍රලේඛ අංක 5 / 2020 02 (අ) චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය.
1.5.1(ඊ) i	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය/මූදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටයෙහි පරිදි ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.	ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගත යුතුය.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.1.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනයේ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයෙහි මගී ප්‍රවාහන වල වටිනාකම රු.586,420,850 ලෙසද ස්ථාවර වත්කම් ලේඛනයේ මගී ප්‍රවාහන වල වටිනාකම රු.671,921,050 ක් ලෙසද දැක්වීමෙන් රු.85,500,200 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) පොලිස් දෙපාර්තමේන්තුව , කාර්මික විද්‍යාලය, සත්ව නිෂ්පාදනයන සෞඛ්‍යය දෙපාර්තමේන්තුව වෙත පවරා දී ඇති වටිනකම රු.24,900,000 ක් වූ වාහන 03 ක වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත්ව නොතිබූ අතර මූල්‍ය ප්‍රකාශනයේ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයෙහි අවසන් ශේෂය වන රු.586,420,850 තුළ මෙම වටිනාකම ඇතුළත් වී ඇත්දැයි යන්න විගණනයට නහවුරු කර ගැනීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් වී නොතිබුණි.

(ඇ) ස්ථාවර වත්කම් ලේඛනයෙහි වාහන පිළිබඳව හා ඡායා පිටපත් යන්ත්‍ර පිලිබඳ තොරතුරු පමණක් ඇතුළත් කර ඇති අතර කාර්යාල උපකරණ, පරිගණක උපකරණ, විද්‍යුත් උපකරණ, සන්නිවේදන උපකරණ, ගෘහභාණ්ඩ යන වත්කම් පිළිබඳ තොරතුරු ඇතුලත් නොවූ හෙයින් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ වෙනත් යන්ත්‍ර හා උපකරණ වටිනාකම වන රු.29,284,746 අගය නහවුරු කර ගැනීමට නොහැකි විය.

1.6.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය සතු PF-7316 , JO-6958, CAG-8807, 302-0610, KX-7664, GD-2079 වාහන 06ක ලියාපදිංචි සහතික විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) අමාත්‍යාංශය සතු වාහන 8 ක් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ද , වාහන 3ක් වෙළඳ අමාත්‍යාංශයට ද වාහන 5ක් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපිරිතමෙන්තුව ද වාහන 3ක් වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ද වාහන 1ක් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය ද වාහන 1 සමාජ සේවා අමාත්‍යාංශයටද වාහන 3ක් වී අලෙවි මණ්ඩලයටද මුදාහැරීමේ පදනම් සහ අනුමැතීන් විගණනයට ඉදිරිපත් නොවිය.

1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

	ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
I.	ස්ථාවර වත්කම් ලේඛනය	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර වක්‍රලේඛය/මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටයෙහි	යාවත්කාලීන කර නොතිබුණි.
II.	විදුලි උපකරණ පිළිබඳ ලේඛනය	මුදල් රෙගුලාසි 454(2)	යාවත්කාලීන කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූලික වියදම් ඇස්තමේන්තුව හා සංශෝධිත වියදම් ඇස්තමේන්තුව පිළියෙල කිරීමේදී වැය විෂයන් 07 ක විවලතාවය සෘණ සියයට 50 සිට ධන සියයට 481 අතර පරාසයක් වෙනස් වී තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) වැය විෂයන් වල සංශෝධිත ඇස්තමේන්තුවෙන් සියයට 20 ඉක්මවූ ඉතිරිවීම් සියයට 20 සිට සියයට 100 දක්වා ඇති අවස්ථා 12ක් නිරීක්ෂණය විය.

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 වර්ෂයට අදාලව අමාත්‍යාංශය විසින් බැරකම් සඳහා බැඳීම් ඇතිකර ගැනීමේදී (427-01-02-1301) වාහන නඩත්තු වියදම් වැය විෂයෙහි ඉතිරිවීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමකින් තොරව ප්‍රතිපාදන ඉක්මවා රු.929,084 බැරකම් සඳහා බැඳීම් ඇතිකරගෙන තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය ප්‍රකාශනයේ බැරකම් හා බැඳීම් පිළිබඳ ප්‍රකාශය සඳහා වටිනාකම් රු.163,734ක් වූ බැරකම් ඇතුලත් කර නොතිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනයේ බැරකම් වල වටිනාකම් රු.163,734කින් අඩුවෙන් දක්වා ඇත .

2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නිරීක්ෂණය

නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජ වාදී ජනරජයේ මුදල් රෙගුලාසි		
I. 371 (5)	370,250	තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීමෙන් පසු අදාල කාර්යය අවසන් කර දින 10 ක් තුල එම අතුරු අග්‍රිම ය නැවත පියවිය යුතු වුවත් දින 27 සිට 253 දක්වා දක්වා කාල ප්‍රමාදයකින් යුතුව නැවත පියවීම් සිදුකර ඇති අවස්ථා 20 ක් වූ අතර වටිනාකම රු.360,250 කි.
396 (අ) , (ආ) , (ඇ) , (ඈ)	687,866	2021 දෙසැම්බර් 31 දිනට වලංගු කාලය අවසන් වූ එනම් වෙක්පත් නිකුත් කල දින සිට මාස 06 වැඩි කාලයක් මුදල් නොකල වෙක්පත් 09ක් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබිණි.
2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ වක්‍රලේඛයේ 7 ඡේදය		2021 වර්ෂයේ දී මිළ දී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාල වෙත ඉදිරිපත් කර නොතිබුණි.
ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය		
2.14.1 ගි 3 ඡේදය		ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් වෙළඳපල මිල සැදහුම් ක්‍රමය යටතේ සැපයුම් හා සේවා ලබාගැනීමේදී

වාර්ෂිකව විවෘත දැන්වීම් තුළින් යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලබන ප්‍රසම්පාදනකරුවන් හා කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ලේඛනයක් පවත්වාගත යුතු වුවද අමාත්‍යාංශය විසින් එවැනි ලේඛනයක් නඩත්තු කර නොතිබුණු අතර බහුලව මිලදී ගැනීම් සිදුකර තිබුණේ වෙළඳපල මිල සැදහුම් ක්‍රමය යොදාගනිමිනි.

2.7.4 ඡේදය

අමාත්‍යාංශය විසින් විශාල කොන්ත්‍රාත් හා සුළු කොන්ත්‍රාත් ප්‍රසම්පාදන කමිටුව තුළ විකල්ප සාමාජිකයෙකුද පත්කර නොතිබුණි.

2.7.4 (ඇ) ඡේදය

පත්කරන ලද ප්‍රසම්පාදන කමිටුවට එම විෂයෙහි හසල දැනුමැති, අමාත්‍යාංශයෙන් බාහිර පුද්ගලයෙකු පත්කළ යුතු වුවද අමාත්‍යාංශය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

4.2.1 ඡේදය

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ආකෘතියට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි එම එක් එක් ප්‍රසම්පාදන කාර්යය ආරම්භක කිරීමට අපේක්ෂිත දිනය හා අවසන් කිරීමට අපේක්ෂිත දිනය සඳහන් කළ යුතු වුවත් අමාත්‍යාංශය විසින් දිනය සඳහන් කරනු වෙනුවට අවශ්‍යතාව පරිදි යනුවෙන් සටහන් කර තිබුණි .

සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්මෙහි ප්‍රසම්පාදන කාර්යයන් ඉටුකිරීමේ ප්‍රගතිය දැක්වීමේදී සැලසුමට අනුව කාර්තුමය වශයෙන් ඉදිරිපත් කිරීම වෙනුවට සමස්තයක් ලෙස දක්වා තිබුණි.

8.9.3 හි (ආ)ඡේදය	5,416,330	රු.500,000ක් ඉක්මවන භාණ්ඩ හා වැඩ කොන්ත්‍රාත් සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹිය යුතු වුවද මාර්ගගත ක්‍රමයට රැස්වීම් පැවැත්වීම සඳහා ගබඩ පරිපාලන ඒකකයක් ස්ථාපිත කිරීම, Workstation මිලදී ගැනීම, ඩෙස්ක්ටොප් පරිගණක 10ක්, ලැප්ටොප් පරිගණක 05ක් හා ෆොටෝ කොපි යන්ත්‍ර 03ක් මිලදී ගැනීම හා ලැප්ටොප් පරිගණක 05 ක් මිලදී ගැනීම යන ප්‍රසම්පාදනය අවස්ථා 04 හි දී ඒ අනුව කටයුතු කර නොතිබුණි.
6.3.3 හා 6.3.6 ඡේදය	1,491,805	ලද සියළුම ලංසු විවෘත කිරීමේදී ලංසු විවෘත කිරීමේ කමිටුව විසින් ඒවා මුද්‍රා තබා අත්සන් කළ යුතු අතර ඒවා ලංසු විවෘත කිරීම පිළිබඳ වාර්තාවක සටහන් කළ යුතු වුවද අමාත්‍යාවරයා සඳහා සාකච්ඡා මෙසයක් හා පුටු 09ක් ලබා ගැනීම, මහෝගනී සාකච්ඡා මේස 02ක් මිලදී ගැනීම, ලැප්ටොප් පරිගණක 05ක් මිලදී ගැනීම යන ප්‍රසම්පාදන අවස්ථා 03 හි දී ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2.5 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සේවය හැරගිය නිළධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු වසර 05ට වඩා වැඩි ණය ශේෂය රු.99,450ක් අයකර ගැනීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV ඡේදයේ 4.5 වගන්තිය අනුව කටයුතු කර නොතිබුණි. මියගිය නිළධාරියෙකුගෙන් අයවිය යුතු වසර 02ට වැඩි ණය ශේෂයක් වන රු.152,745 අයකර ගැනීම සඳහා ආයතන සංග්‍රහයේ XXI ඡේදයේ 4.4 වගන්තිය අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 485(4) ප්‍රකාරව ස්ථාන මාරුවී ගිය නිළධාරීන්ගෙන් නවදුරටත් අයවිය යුතුව ඇති ශේෂය නිරවුල් කරගත යුතු වුවත් වසර 1ත් 2ත් අතර වූ රු.200,700 වන ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශනයේ ඉදිරිපත් කර ඇති අත්තිකරම් ගිනුමේ සාරාංශයේ වර්ෂය තුල බැර කිරීම් හරස් සටහන් මගින් රු.3,621,628 ලෙස දක්වා තිබුණද රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට වාර්ෂික සැසඳුම් ප්‍රකාශයේ එම වටිනාකම් රු.4,279,180 ක් වූයෙන් රු .657,552ක වෙනසක් නිරීක්ෂණය විය .

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අනුමත ක්‍රියාකාරී සැලැස්මෙහි මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයෙහි 2014 පෙබරවාරි 14 දිනැති අංක 01/2014 චක්‍රලේඛයෙහි 03 ඡේදයට අනුව වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අරමුදල් අවශ්‍යතා සැලැස්ම (Imprest requirement plan) අන්තර්ගත වී නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්මෙහි අන්තර්ගත වැඩසටහන් සඳහා ඉලක්කගත කාල සීමාව 2021 ජනවාරි 01 සිට 2021 දෙසැම්බර් 31 ලෙස දක්වා ඇති අතර දියර කිරි පරිභෝජනය ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරීම, සත්ත්ව අභිජනන ගොවිපොළවල් ස්ථාපනය කිරීම, සුකර කර්මාන්ත සංවර්ධනය, සුළු හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපොළ සංවර්ධනය, කුඩා හා මධ්‍ය පරිමාණ කිරි ගොවිපොළ කළමනාකරණය තුළින් ඵලදායිතාවය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය/ වැඩසටහන යන 05 ක් සඳහා ක්‍රියාත්මක කිරීම සහ අවසන් කිරීමට අපේක්ෂිත නිශ්චිත දිනයන් හඳුනාගෙන නොතිබුණි.

(ඇ) ක්‍රියාකාරී සැලැස්මෙහි අන්තර්ගත වැඩසටහන් 06හි ඇතුළත් එක් එක් ව්‍යාපෘතීන් මෙහෙයවීම හා කාර්යසාධනය පරීක්ෂාව සඳහා රුපියල් මිලියන 5ක් වෙන්කර ඇති නමුත් ක්‍රියාකාරී සැලැස්මෙහි ඒ සඳහා නිර්ණායක (Key Performance Indicator) හඳුනාගෙන නොතිබුණි.

(ඇ) කුඩා හා මධ්‍ය පරිමාණ කිරි ගොවිපොළ කළමනාකරණය තුළින් ඵලදායිතාවය ඉහළ නැංවීමේ වැඩසටහන යටතේ දක්වා ඇති රෝග නිවාරණය සහ ඩිජිටල්කරණය ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 27ක් වෙන්කර ඇති අතර එම ව්‍යාපෘතිය යටතේ කොපමණ උපකරණ ලබාගන්නේද සහ රෝග නිවාරණය සිදුකරන ආකාරය පිළිබඳ නොරතුරු පැහැදිලිව දක්වා නොතිබුණි.

(ඉ) දියර කිරි පරිභෝජනය ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරීමේ වැඩසටහන යටතේ රාජ්‍ය ආයතන සඳහා Vending Machine 40ක් ලබා දීමේ ව්‍යාපෘතියක් ඇතුළත් කර රුපියල් මිලියන 03ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. මේ සඳහා මිල්කෝ ආයතනය තෝරාගෙන තිබූ අතර Vending Machine ලබා දීම වෙනුවට කිරි සිසිලක යන්ත්‍ර 75ක් ලබාදීමට කටයුතු කර ඇත. එබැවින් ක්‍රියාකාරී සැලැස්ම සැකසීමේදී නිවැරදි අවශ්‍යතාවයන් සොයා බලා ව්‍යාපෘති ඇතුළත් කිරීමට අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය.

(ඊ) කුඩා හා මධ්‍ය පරිමාණ කිරි ගොවිපොළ කළමනාකරණය තුළින් ඵලදායිතාවය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය සඳහා වෙන්කර ඇති රුපියල් මිලියන 450න් රුපියල් මිලියන 275.24ක් වැය කර ඇති බව දක්වා ඇතත් එහි සඳහන් ව්‍යාපෘති 12 හි එක් එක් ව්‍යාපෘතිය සඳහා වැයවූ පිරිවැය වෙන් වෙන්ව දක්වා නොතිබුණි.

(උ) ගවයන් 100,000ක් හඳුනාගැනීම, මිල්කෝ ආයතනය වෙත අභිජනන උපකරණ ලබාදීම යන ව්‍යාපෘති 02 ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කර පිළිවෙලින් රුපියල් මිලියන 13ක් හා රුපියල් මිලියන 5.1ක ප්‍රතිපාදන වෙන්කර ඇතත් එම ව්‍යාපෘතීන් සඳහා ප්‍රසම්පාදන කටයුතු සත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය දෙපාර්තමේන්තුව මඟින් ඉටු කර තිබුණි.

3.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 වර්ෂය තුළ ආරම්භ කිරීමට අපේක්ෂිතව තිබූ රුපියල් මිලියන 02ක ඇස්තමේන්තුගත පිරිවැයකින් යුතු පුන්තෝට්ටම ප්‍රාදේශීය පශු සම්පත් ගොවිපොළෙහි යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය 2021 වර්ෂය තුළ ආරම්භ කොට නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) 2021 වසර තුළ ආරම්භ කිරීමට නියමිතව තිබූ පේදුරුතුඩුව පශු වෛද්‍ය කාර්යාලය ඉදිකිරීමේ ව්‍යාපෘතිය එම වසර තුළ ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මධ්‍ය පරිමාණ පශු සම්පත් සංවර්ධන වැඩසටහන යටතේ දක්වා ඇති රුපියල් මිලියන 5ක් වෙන්කරන ලද වර්ෂය තුල නිම කිරීමට අපේක්ෂිතව තිබූ Construction of GVS office ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් කටයුතු 2021 වර්ෂය තුල ආරම්භ කර නොතිබුණි.

3.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

සත්ව අභිජනන ගොවිපොළවල් ස්ථාපනය කිරීමේ වැඩසටහන යටතේ වැඩමුළු/පර්යේෂණ සහ පුහුණු වැඩසටහන් 20ක් ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයවීම හා කාර්යසාධන පරීක්ෂාව සඳහා ව්‍යෘපෘතීන් 02ක් ඇතුළත් කර ඒ සඳහා පිළිවෙලින් රුපියල් මිලියන 2ක් හා රුපියල් මිලියනයක් වෙන්කර ඇතත් එහි ප්‍රගතිය පිළිබඳ තොරතුරු කිසිවක් කාර්යසාධන වාර්තාවෙහි ඇතුළත් කර නොතිබුණි.

3.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම් විසින් 2021 ජූලි 20 දින අමාත්‍යවරයා සඳහා සාකච්ඡා මේසයක් පමණක් ලබා ගැනීමට ලිපියක් මඟින් ඉල්ලුම් කර තිබූ අතර අමාත්‍යාංශය විසින් අවශ්‍යතාවය හඳුනාගැනීමෙන් තොරව සාකච්ඡා මේසයක් හා රු.187,830ක් වැය කර තවත් පුටු 09ක් මිලදී ගෙන තිබුණි.

(ආ) වටිනාකම් රු.376,805 වූ අමාත්‍යවරයා සඳහා සාකච්ඡා මේසයක් හා පුටු 09 ක් ලබා ගැනීමෙදි ප්‍රසම්පාදනයේ අරමුණු ඉටුවන පරිදි ලංසුකරුවන් වෙතින් සාර්ථක ලංසු ගෙන්වා ගැනීම සඳහා අවශ්‍යතාවය අනුව පිළියෙල කරන ලද පිරිවිතරයන් ලිපිගොනුවේ දක්නට නොලැබුණි.තවද අවශ්‍යතාවයට අනුව තෝරාගත් සැපයුම්කරුවන් 04 දෙනෙකු වෙතින් මිල ගණන් කැඳවා නොතිබීමෙන් අයදුම් කරන ලද ලංසු 04න් ලංසු 03ක් ම අවශ්‍යතාවයට සරිලන පරිදි ලංසු ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) වටිනාකම රු.1,322,125ක්වූ මාර්ගගත ක්‍රමයට රැස්වීම් පැවැත්වීම සඳහා ශබ්ද පරිපාලන ඒකකයක් ස්ථාපිත කිරීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලංසු ඇගයීමේදී ඉදිරිපත් කරන ලද පිරිවිතරයන්හි අනුකූලතාවය පිළිබඳ ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා නොතිබුණි. ඒ අනුව පිරිවිතරයෙහි ප්‍රක්ෂේපණ යන්ත්‍රය (projector) හා කැමරාවෙහි (Zoom camera) වගකීම් කාලය වසර 03ක් විය යුතු බව දක්වා තිබුණද තෝරාගත් සැපයුම්කරු විසින් ඉදිරිපත් කරන ලද ලංසුවෙහි වගකීම් කාලය වසර 01ක් ලෙස දක්වා තිබුණි. මේ සඳහා සුදුසුකම්ලත් පාර්ශවයකගෙන් නිර්දේශයක් හෝ ලබා නොගෙන 2021 දෙසැම්බර් 30 දින ගෙවීම් සිදුකර තිබුණද ඊට අදාළ භාණ්ඩ අමාත්‍යාංශයේ ගබඩාව වෙත භාරදී තිබුණේ 2022 ජනවාරි 06 දිනදීය තවද ශබ්ද පරිපාලන ඒකකයක් ස්ථාපිත කිරීමේ කාර්යය වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් කර නොතිබුණි.

(ඈ) ඩෙස්ක්ටොප් පරිගණක 10ක්, ලැප්ටොප් පරිගණක 05ක් හා ෆොටෝ කොපි යන්ත්‍ර 03ක් මිලදී ගැනීම.

i. Metropolitan Office (Pvt) Ltd. ආයතනය විසින් ඉදිරිපත් කල ලංසුවෙහි ඒකක මිල රු.148,500ක් ලෙස දක්වා ඇති අතර Operating System හා Productivity Software සඳහා වෙනම මිල ගණන් දක්වා නොමැති නමුත් තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවෙහි පිළිවෙලින් රු.32,500 හා රු.55,450 (එකතුකළ අගය මත බදු සහිතව) ලෙස දක්වා මිල ගණන් සසඳා ඇත්තේ කෙසේද යන්න ගැටළුසහගතය.

ii. 2021.07.27 දිනැති ප්‍රසම්පාදන කමිටු වාර්තාව මගින් ලැප්ටොප් පරිගණක 05ක් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදනය පිරිනමා ඇති Office Network (Pvt) Ltd. ආයතනය විසින් ප්‍රමාණවත් තොග නොමැති බැවින් ලංසුව ඉල්ලා අස්කර ගෙන ඇති බව දක්වා ඇත. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11 අනුව රු.918,230ක වටිනාකමින් යුත් මෙම ප්‍රසම්පාදනය සඳහා ලංසු සුරක්ෂණ ලබාගෙන නොමැති බැවින් සිදුවූ කාල ප්‍රමාදය හා මුදල් අහිමිවීම සම්බන්ධයෙන් මෙම ආයතනයෙන් අයකරගැනීමට අපොහොසත් වී තිබුණි.

(ඉ) ලැප්ටොප් පරිගණක 05ක් මිලදී ගැනීම.

i. තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවෙහි John Keells Office Automation (Pvt.) Ltd. ආයතනය විසින් ඉදිරිපත් කල මිල ලෙස රු.265,800ක් දක්වා තිබුනද සැපයුම්කරු විසින් ඉදිරිපත් කල ලංසුවෙහි දක්වා තිබුනේ රු.147,000ක් බැවින් රු.118,800ක වෙනසක්

නිරීක්ෂණය විය. ලංසු ඇගයීමේදීද Operating System හා Productivity Software සඳහා වන මිල ගණන් වෙනම දක්වන ලෙස හා එම මිල ගණන් මිල ඇගයීම සඳහා පාදක කර නොගන්නා බව පිරිවිතර වල පැහැදිලිව දක්වා තිබුණි. Operating System හා Productivity Software සඳහා සැපයුම්කරු විසින් වෙනම දක්වා ඇති මිල ගණන් තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවෙහි ලංසු වටිනාකමට එකතු කර දක්වා තිබීම ගැටළු සහගතය. තවද තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව සමග දක්වා ඇති පිරිවිතර ඇගයීම් ලේඛනයේ ලංසු වටිනාකම ලෙස දක්වා ඇත්තේද රු.147,000 බව තවදුරටත් නිරීක්ෂණය විය.

ii. Singer Sri Lanka PLC හා John Keells Office Automation (Pvt.) Ltd. ආයතන 02 විසින් ඉදිරිපත්කරන ලද ලංසුවල මුල් පිටපත වෙනුවට ඡායා පිටපත් ප්‍රසම්පාදන ගොනුවෙහි ඉදිරිපත් කර තිබුණි.

(ඒ) රාජ්‍ය අමාත්‍යවරයාගේ නිල නිවස සඳහා ගෘහ භාණ්ඩ ලබාගැනීම සඳහා ගෘහභාණ්ඩ අයිතම 10ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනය රාජ්‍ය දැව සංස්ථාව වෙත පිරිනමා තිබුණි.

i. රාජ්‍ය ආයතනයකින් මිලදී ගැනීමට ප්‍රමුඛතාවය ලබාදීම හා පැවැත්ම සලකා බලා මෙම ප්‍රසම්පාදනය රාජ්‍ය දැව සංස්ථාව වෙත පිරිනමා ඇති බව ප්‍රසම්පාදන කමිටු වාර්තාවෙහි දක්වා තිබුණි. මිල ගණන් සලකා බැලීමේදී රාජ්‍ය දැව සංස්ථාවෙහි මිල ගණන් හා ඉදිරිපත් වූ අවම මිල අතර රු.510,548ක විශාල පරතරයක් නිරීක්ෂණය විය.

ii. රාජ්‍ය අමාත්‍යවරයාගේ නිල නිවස සඳහා අවශ්‍ය කරන ගෘහභාණ්ඩ 49ක ලැයිස්තුවක් මිලදී ගැනීම සඳහා ලංසු කැඳවීමට ඉදිරිපත් කර තිබුණි. එම ලැයිස්තුවෙහි අන්තර්ගත ගෘහභාණ්ඩ 10ක් සඳහා වෙනම ලංසු කැඳවා රාජ්‍ය දැව සංස්ථාව වෙතින් මිලදී ගෙන තිබුණි. මෙම ප්‍රසම්පාදනය සඳහා අන්තර්ගත නොකර සෘජු මිලදී ගැනීම් යටතේ ප්‍රධාන ගණකාධිකාරිගේ අනුමැතිය යටතේ අවස්ථා 2කදී වටිනාකම රු.283,227ක් වූ මෙවට 06 ක් Richard Pieris Distributors Ltd වෙතින් මිලදීගෙන තිබුණි .

3.3 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් මුදල් රෙගුලාසි 106 හා 113 යටතේ වන පාඩු අත්හැරීම් පිළිබඳ

ප්‍රකාශයේ කාල විශ්ලේෂණයට අනුව වසර 5 ට වැඩි හානි 128,204 හා වසර 5 ට අඩු රු 68,200 ලෙස එකතුව රු.196,404 ක් වූ හානි හා පාඩු වටිනාකම් අදාල වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට හෝ පොත් වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් මුදල් රෙගුලාසි 106 හා 113 යටතේ වන පාඩු අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ තවදුරටත් කපහැරීමට හෝ අත්හැරීමට ඇති වටිනාකම් රු 180,205 ක් ලෙසද කාල විශ්ලේෂණයට අනුව එම වටිනාකම් රු 196,404 ක් වීමෙන් රු 16,199 ක වෙනසක් නිරීක්ෂණ විය.

3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය විසින් නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ආයතන වෙතින් ලබාගෙන තිබූ PG-1773, CAB-4184, PF-7316 , PH-0474 , PF-7639, PF-8209 වාහන 06ක අයිතිය පවරා ගැනීමට සම්මාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 1645(අ) හා මුදල් රෙගුලාසි 1647(අ) අනුව වාහන ලොග් පොත් ක්‍රමවත් හා විධිමත් ලෙස තොරතුරු ඇතුළත් කර යාවත්කාලීන තත්ත්වයෙන් පවත්වාගෙන යා යුතු වුවද දැවෙන ඉන්ධන ප්‍රමාණය,අයිතිය හා භාරකාරත්වය යනා දී තොරතුරු ඇතුළත් කර නොතිබුණි.

(ඇ) අංක 30/2016 හා 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි 3.1 ප්‍රකාරව මාස 12ක කාල සීමාවකින් පසුව හෝ කිලෝමීටර 25000ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් සිදු කළ යුතු වුවද අමාත්‍යාංශයෙහි වාහන සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නිබූ බව විගණනයේදී නිරීක්ෂණය නොවිය.

(ඈ) අමාත්‍යාංශයේ 2021 හාණ්ඩ සමීක්ෂණ වාර්තාව ට අනුව ලෙජරය අනුව ශේෂය හා තත්‍ය ශේෂය අතර අතිරික්ත හණ්ඩ අයිතම 205ක් ද හාණ්ඩ අයිතම 366ක ඌනතාවයක් ද නිරීක්ෂණය විය.

(ඉ) අමාත්‍යාංශයේ 2021 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවෙහි ඇතුලත් උචිත ප්‍රධාන ඉන්වෙන්ට්‍රි ලේඛනයෙහි ඇතුළත් නොවූ භාණ්ඩ අයිතම 193 ක් නිරීක්ෂණය විය .

(ඊ) අමාත්‍යාංශයේ භාණ්ඩ කේතකරණයකට ලක් නොකිරීම හේතුවෙන් එකම අයිතමය විවිධ නම වලින් සටහන් වීමට හැකි බැවින් භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිවැරදිතාවය පිළිබඳ විගණනයට ගැටලුකාරී විය .

(උ) ස්ථාවර වත්කම් ලෙජරයහි ස්ථාවර වත්කම් වර්ග 30 ක වටිනාකම් කිසිවක් සටහන් කර නොතිබුණි .

(ඌ)ස්ථාවර වත්කම් ලෙජරයහි ස්ථාවර වත්කම් 08 ක 2021.01.01 දිනට පැවැති ශේෂයන් සටහන් කර නොතිබුණි.

4 මානව සම්පත් කළමනාකරණය

4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

(අ) අමාත්‍යාංශයේ 2021 වර්ෂය සඳහා අනුමත කාර්ය මණ්ඩලය 594 ක් වුවද තත්‍ය කාර්ය මණ්ඩලය 559 ක් වීමෙන් තනතුරු 37 ක් පුරප්පාඩුව පැවතුණි. විස්තර පහත දැක්වේ.

සේවා මට්ටම	අනුමත කාර්ය මණ්ඩලය	තත්‍ය කාර්ය මණ්ඩලය	පුරප්පාඩු සංඛ්‍යාව	අතිරික්ත සංඛ්‍යාව
ජේෂ්ඨ මට්ටම	30	19	11	-
තෘතීය මට්ටම	03	02	02	01
ද්විතියික මට්ටම	523	502	21	-
ප්‍රාථමික මට්ටම	35	32	03	-
වෙනත්	03	04	-	01
එකතුව	**594**	**559**	37	**02**

(ආ) අංක 2/ 2018 හා 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් ඇමුණුම 02 ආකෘතිය ප්‍රකාරව කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුම ඇතුළත් වන පරිදි අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ලබා දෙමින් මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර අමාත්‍යාංශ කාර්ය මණ්ඩල නිලධාරීන් 20 දෙනකු සඳහා පමණක් රු.160,500 ක් වැය කරමින් වැඩමුළු/සම්මන්ත්‍රණ 05 ක් සංවිධිත වර්ෂය තුළ දී පවත්වා තිබුණි.

එච්. එන්. රණතුංග

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

4. කාර්යසාධන දර්ශක

4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

#	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	75%-89%	50%-74%
01	දේශීය කිරි නිෂ්පාදනය වැඩිවීමේ ප්‍රමාණය (ලීටර් මිලියන)		√	
02	දේශීය බිත්තර නිෂ්පාදනය වැඩිවීමේ ප්‍රමාණය (බිත්තර/මිලියන)	√		
03.	දේශීය කුකුළු මස් නිෂ්පාදනය වැඩිවීමේ ප්‍රමාණය (මෙ.ටො.)	√		

5. තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1. හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය/අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49	50%-74%	75%-100%
(i) සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගීබව අවසන් කිරීම **(ii) සාගින්න නැතිකර ආහාර සුරක්ෂිතතාවය හා යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම** **(iii) සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය පූර්ණ ඵලදායි හා යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම** **(iv) තිරසර පරිභෝජනය හා නිෂ්පාදන රටා සුරක්ෂිත කිරීම**	වසර 2021 වන විට දියර කිරි නිෂ්පාදනය ලීටර මිලියන 492.62 දක්වා ඉහළ නැංවීම	දේශීය කිරි නිෂ්පාදනය වැඩිවීමේ ප්‍රමාණය (ලීටර් මිලියන)			√
	2021 වර්ෂය තුළදී බිත්තර මිලියන 3,180.8ක් නිෂ්පාදනය කිරීම	බිත්තර නිෂ්පාදනය වැඩිවීමේ ප්‍රමාණය (බිත්තර/මිලියන)			√
	2021 වර්ෂය තුළදී කුකුළු මස් මෙ.ටො. 227,300 ක් නිෂ්පාදනය කිරීම	කුකුළු මස් නිෂ්පාදනය වැඩිවීමේ ප්‍රමාණය (මෙ.ටො.)			√

5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

2021 වර්ෂය තුළ දිවයිනේ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම් කරන ලද ඉලක්ක වෙත ලඟා වීමට අපහසු විය.

6. මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	31	20	11
තෘතීයික	03	02	01
ද්විතීයික	523	502	21
ප්‍රාථමික	37	35	02

6.2. ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න

අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු පහතින් සඳහන් කර ඇත.

#	තනතුර	සේවය	පුරප්පාඩු සංඛ්‍යාව
		ජ්‍යෙෂ්ඨ මට්ටම	
1.	අතිරේක ලේකම් (කෘෂිකර්ම)	ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය	01
2.	සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ (කෘෂිකර්ම)	ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය	01
3.	අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු)	ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය	01
4.	අධ්‍යක්ෂ (ඉංජිනේරු)	ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය	01
5.	සහකාර ලේකම්	ශ්‍රී ලංකා පරිපාලන සේවය	02
6.	අධ්‍යක්ෂ	සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය	03
7.	නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ/පශු වෛද්‍ය නිලධාරී	සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය	03
8.	ප්‍රධාන මූල්‍ය නිලධාරී	ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය	01
9.	අභ්‍යන්තර විගණක	ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය	01
	අතිරේක ලේකම් (කෘෂිකර්ම) - 01 *ප්‍රධාන මූල්‍ය නිලධාරී - 01* *අධ්‍යක්ෂ (සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය) - 02*	*රාජකාරී ඉටු කිරීමට / වැඩබැලීමට නිලධාරීන් පත් කර ඇත.*	
		තෘතීයික මට්ටම	
10.	පරිපාලන නිලධාරී	කළමනාකරණ සේවා නිලධාරී සේවය	01
		ද්විතීයික මට්ටම	
11.	සංවර්ධන නිලධාරී	සංවර්ධන නිලධාරී සේවය	15
12.	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය	01

#	තනතුර	සේවය	පුරප්පාඩු සංඛ්‍යාව
13.	කළමනාකරණ සේවා නිලධාරී	කළමනාකරණ සේවා නිලධාරී සේවය	04
14.	පිළිගැනීමේ නිලධාරී		01
	ප්‍රාථමික මට්ටම		
15.	රියදුරු	ඒකාබද්ධ රියදුරු සේවය	02
16.	කාර්යාල සේවක	කාර්යාල සේවක සේවය	01

ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන්ගේ මානව සම්පත් හිඟය ආයතනයේ කාර්යසාධනයට අයහපත් අයුරින් බලපායි.

6.3. මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමවුම/ ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
රාජ්‍ය ප්‍රසම්පාදන කළමනාකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	04	දින 10	40		දේශීය	ආයතනයේ කටයුතු සඳහා සෘජුවම දායකවේ
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය	03	දින 03 මාර්ගගත	15			
රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම	15	දින 01 මාර්ගගත	25			
කාර්යාල කළමනාකරණ හා මූදල් රෙගුලාසි	18	දින 02 මාර්ගගත	21			
පෞද්ගලික ලිපි ගොනු පවත්වාගෙන යාම	13	දින 02	21			
විනය සහ කාර්යාලයීය ආචාර විධි	07	දින 02	59.5			

07. අනුකූලතා වාර්තාව

#	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ /ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම්(වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
2	**පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම(මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/218 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන /පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		

#	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව,රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD)නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1-2019අනුව,වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස්කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	මසකට වැඩි කාලයක් ගතවී ඇතැම් විගණන වාර්තා වලට පිළිතුරු ලැබී ඇති අතර ඇතැම් විගණන වාර්තා සඳහා පිළිතුරු මේ දක්වා ලැබී නොමැත.	අභ්‍යන්තර විගණන වාර්තාවන්ට නොපමාව පිළිතුරු ලබා දෙන ලෙස අදාළ අංශ දැනුවත් කිරීම
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4)උප වගන්තිය ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3)ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

#	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ.		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017දරණ වත්කම් කළමණාකරන චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව ,එම චක්‍ර ලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාන්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ,ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදුකිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
9.2	වාහන ගර්හිත වී මාස 06ට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල නොවේ	වාහනවල ලියාපදිංචි අයිතිය පවරා ගැනීමට අදාළව ගැටළු පැවතීම හේතුවේ.	අදාළ ආයතන සම්බන්ධීකරණයෙන් පවතින ගැටළු නිරාකරණය කිරීමට කටයුතු කිරීම
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		

#	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ.		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ. (ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් කල්බදු වාරික සම්පූර්ණයෙන් ගෙවා අවසන් වී ඇති වාහනවලට අදාළව)		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම්**			
13.1	කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

#	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම , එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	කටයුතු කරමින් පවතී		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2008(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	මහජනතාව සමඟ සෘජුව කටයුතු නොකරන බැවින් අදාළ නොවේ		

#	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය නිරණ ක්‍රියාමාර්ග
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදන කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇඟයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	මහජනතාව සමඟ සෘජුව කටයුතු නොකරන බැවින් අදාළ නොවේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	අඩක් නිම කොට ඇත.	2022 වර්ෂය සඳහා සකස් කරමින් පවතී.
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 ට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ	කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් කාර්ය මණ්ඩලයෙන් අඩකට පමණ පුහුණු අවස්ථා ලබාදීමට කටයුතු කර ඇත.	2022 වර්ෂය සඳහා තහවුරු කොට තිබේ.
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	කාර්ය මණ්ඩලයෙන් කොටසක් සඳහා පමණක් ගිවිසුම් අත්සන් කර ඇත.	2022 වර්ෂය සඳහා ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු සිදු කෙරේ.
19.4	ඉහත චක්‍ර ලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම,නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත්කොට තිබීම	අනුකූලවේ.		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වාදී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		